# දහත් වට්ගුව

## ලෙස්ටර්

ලෙස්ටර් මහත්තය ජීවිතයෙන් සමුගැනීම දැන් අතීතයට ගිය කතාවක්. චූටි මල්ලිට නම් අවංකවම ඒක දැනුණෙ නැහැ. දෙළොවක් අතර, ගම් පෙරළිය ,රන්සළු, නිධානය අහම්බෙන් වගේ චිත්‍රපටි උළෙලකදි දැක්කට ඒ දවස් වල ජීවිතය ගැන ලොකු අවබෝධයක් නොතිබුණ නිසා ඒවා මහ බෝරිං වුණා. ඒත් පස්සෙ කාලෙකදි හඳගමලගේ විමුක්තිලගේ ප්‍රසන්නලාගේ චිත්‍රපටත් ජාත්‍යන්තර සිනමා උළෙලවලදි හොඳ චිත්‍රපටත් බලලා රස වින්දනය වර්ධනය වුණාට පස්සෙ තමයි තේරුම් ගියේ කට්ටිය වැඩ දාලා මාර චිත්‍රපට දැන් හැදුවට ලෙස්ටර් මහත්තයට මිනිසුන්ගෙ ජීවිත ගති ස්වභාවය ගැන චිත්‍රපට හදන්න මීටර් වෙලා තියෙන්නෙ මීට දශක 5 කටත් ඉස්සෙල්ල කියන එක. එහෙම දැක්මක් තිබුණ මිනිසුන්ගෙ කාලය අවසන් වෙලා මං හිතන්නෙ.

ලෙස්ටර් මහත්තයගෙ මළගෙදරදි උස්සපු රණ මයුර සම්මානේ ගැන කතාව මතුවෙද්දි චූටි මල්ලිට මතක්වුණේ ලෙස්ටර්ගෙ ගම්පෙරළියට ඉන්දියාවෙන් ලැබුණ රණ තිසර සම්මානෙ. ඒක එක්ක පොඩි සම්බන්ධයක් තියෙනවා චූටි මල්ලිටත්. නවදිල්ලි චිත්‍රපට උළෙලට ගම්පෙරළියත් අරන් සහභාගි වුණ තුන්දෙනාගෙන් එක්කෙනෙක් චූටි මල්ලිගෙ මාමා. ගාමිණී ෆොන්සේකා සහ ඇන්ටන් වික්‍රමසිංහ අනිත් දෙන්නා. එහිදි සිදුවුණ බොහෝ රසවත් දේ හා ඊට අදාල බොහෝ ඡායාරූප චූටි මල්ලි දැකලා තියෙනවා. ඒ චිත්‍රපට අළෙලේදී අපට ඉන්දියානුවන්ගෙන් බොහෝ අකටයුතු සිදුවෙලා තියෙනවා. පූර්ව දර්ශන වලින් පසුව අවසන් වටයේදි ගම්පෙරළියට සම්මානයක් ලැබෙන බව ස්ථිර වශයෙන්ම දැනගත් ඉන්දියානුවන් චිත්‍රපටය දර්ශනය කරද්දි ෆිල්ම් රීල් මාරු කර මැද අග මාරු කර පෙන්වද්දි අපේ කට්ටිය ප්‍රොජෙක්ෂන් රූම් එකට පැන ඔවුන් සමග වලියක් දාගෙන තමයි වැඩේ ගොඩදාගෙන තියෙන්නෙ.

හැබැයි ඉතින් ගම්පෙරළියට ලැබුණ මේ සම්මානය නිෂ්පාදක ඇන්ටන් වික්‍රමසිංහ තමන් ළගම තියා ගත්තා මිසක් ලෙස්ටර්ට දුන්නෙ නැහැ.

ලෙස්ටර්ගේ ෆිල්ම්ස් ඔක්කොම වගේ චූටි මල්ලි බලලා තියෙනවා. ඒව හැම එකක්ම විශිෂ්ටයි කියන්න බැහැ. හැම නිර්මාණකාරයෙක්ම උඩ යට යන වෙලාවල් තියෙවනෙ. ඔහු හොඳ නිර්මාණකරුවෙක්. ඒකෙ දෙකක් නැහැ. ඔහුගෙ හිස්තැන පුර වන්න සමත් නිර්මාණකරුවන් කීපදෙනෙක්ම අපට ඉන්නවා. ලෙස්ටර්ලා ගාමිණීලා නැති ඒ අනාගතය දිහා සුබ විදිහට බලාගෙන ඉමු.

## මැයි 1

මේ සැරේ මැයි දිනේ එහෙට මෙහෙට කරලා. එහෙම කරන්න පුලුවන්ද? මිනිස්සු ජීවිත පූජා කරලා ලබාගත්ත අයිතීන් සමරණ දිනේ වෙනස් කරන්න තරම් පූජකයන්ගෙ ඉල්ලීම් බලවත් වුණේ කොහොමද? එහෙම ඉල්ලීමකට එරෙහි වෙන්න කොන්දක් මේ ආණ්ඩුවට නැද්ද? මේ ආණ්ඩුවේම ඉන්න පක්ෂෙක නායකයෙක් යටතේ තමයි වතාවක් මැයි දිනය නිහඬ දිනයක් වුණේ. අපට හිතාගන්න බැරි වෙසක් වගේ උත්සවයක් කොහොමද මැයි දිනේට බලපාන්නෙ කියන එක. හරියටම වෙසක් දිනය මැයි පළමුවෙනිදට ආවත් මොකද? මැයි දිනේට යන අය දවල්ට ඒකට යාවි. වෙසක් සමරණ අය ඒක කරාවි. කොහොම වුණත් ආණ්ඩුවේ දින මාරුව නොතකා අදාල දිනයට මැයි සැමරීම කළ පක්ෂ හා සංවිධාන වලට අපේ ආචාරය. ඒක වැඩ කරන මිනිසුන්ගෙ අයිතියක්. ඒක එක අතකට ආණ්ඩුවේ අත්තනෝමතික තීරණයට දක්වන විරෝධයක්ද වුණා. ඒත් දැන් ආපහු මැයි 7 වෙනිදා ඒ කට්ටිය මැයි සමරපු එකේ තේරුම මොකක්ද? ඒ කියන්නෙ අර විරෝධතාව පුස්සක් වෙලා ආණ්ඩුවේ දින මාරුව නොනිල විදිහට පිලිගන්නවා වගේ වැඩක් නෙවෙයිද ඒක.? මේක එතකොට සැබෑ කම්කරු දින සැමරීමක්ද? තමන්ගෙ පිරිස් බලය පෙන්නන්න කරන වැඩක්ද? පිස්සු හැදෙනවා ලොක්කා.

## ඉගෙන ගන්නෙ නැති පාඩමක්

මේ ලියන දවසේ ආපහු 125 ක සෙට් එකක් නීති විරෝධී විදිහට මෙහෙට එන්න හදද්දි මැලේසියාවෙදි මාට්ටු වෙලා කියලා ආරංචි වුණා. මේ පාර ටිකක් දියුණු වෙලා වගේ. ඇවිත් තියෙන්නෙ බෝට්ටුවකින් නෙවෙයි. නැවකින්. නැවක් කිව්වට පොඩි නැවක්. කොච්චර කිව්වත් මිනිස්සු තේරුම් ගන්නෙ නැත්තේ ඇයි ඔස්ට්‍රේලියාවේ ඔය වගේ එන කට්ටියට සළකපු කාලේ ඉවරයි කියලා? මාස කීපයකට ඉස්සෙල්ලා ලංකාවෙදිත් ඒ බව කියලා යන ටීවී ඇඩ් එකක් දැක්කා. ඒවා දැක දැකත් මිනිස්සු තාමත් මෙහෙට එන්න හදන්නෙ මෝඩ කම නිසාද නැත්නම් මේ බිස්නස් එක කරන එවුන්ගෙ සන්නිවේදන දක්ෂතාව නිසාද කියලා මට නම් තේරෙන්නෙ නැහැ. මේක මහ අපරාධයක්. මේ එන හැම මිනිහම එන්නෙ සබ්බ සකලමනාවම උගස් කරලා හරි විකුණලා හරි ගත්ත ලක්ෂ ගාණක් පූජා කරලා. එහෙම ඇවිත් අහුවෙලා හිරේ ඉඳලා අතේ සතේ නැතිව ආපහු යනකොට කොහොමද සනීපෙ. මේකේ වැඩිම වගකීම තියෙන්නෙ ලංකාවේ ආණ්ඩුවට. මිනිසුන් දැනුම් වත්කිරීම ප්‍රමාණවත් නැහැ. එය නොකඩවා කළ යුතු දෙයක්. ඒක රජයේ යුතුකමක්. කොහොමත් ලංකාවෙ මිනිස්සුන්ට යමක් අමතක කරන්න ගතවෙන්නෙ බොහොම පොඩි කාලයක්නෙ. මේක අපට ප්‍රවෘත්තියක් පමණක් වුණාට ලංකාවට සමාජ ප්‍රශ්නයක් බව අමතක කරන්න හොඳ නැහැ.

## හොඳ මිනිස්සු යන කාලයක්

මීට කලිනුත් කිව්ව වගේ හොඳ මිනිස්සු සමුගන්නෙ ඩබල් දාලම තමයි. ලෙස්ටර් සමගම සීටී හඬත් අපට නැතිවුණා. සීටීගේ හඬ ඔරිජිනල් විදිහට අපි රස වින්දෙ ප්‍රියන්ත නිසා. ලංකාවේ සීටීගේ නම්බර්ස් ඇර කිසිම ගායකයකුගේ හෝ ගායිකාවකගේ ගීත ඕනෑම තරාතිරමක ඕනෑම අවස්ථාවක ඕනෑම රටකදි ගැයෙන්නෙ නැති බව අවිවාදිතයි. ඒක ඉදිරියටත් එහෙම තමයි. ඒක තමයි සීටී ගේ හඬෙත් ගීත වලත් ඇති විශේෂත්වය. පියුමක පැණි බොති, මී වදයකි ජීවිතේ, ආනෙ ඩිංගක් නොකියපු කෙනෙක් ඉන්නවා නම් ඒ හෙට ඉපදෙන්න ඉන්න කෙනෙක් තමයි. චූටි මල්ලිට නම් ප්‍රියන්තගේ වියෝව තදට දැනෙනවා. වාසනාවකට වගේ අන්තිම වතාවට ඔහු ඔස්ට්‍රේලියාවට ආ විට ඔහු හමුවීමට හැකි වුණා. එදා මට හිතුණ දෙයක් තමයි ඔහුගේ මුවට මත්පැන් වීදුරු ළං කරන මිනිසුන් මේ කරන්නෙ කොයි තරම් අපරාධයක්ද කියන එක. ඒකෙ ප්‍රතිඵල තමයි මේ. මේ කෙටි සටහන ප්‍රියන්තට උපහාරයක් වේවා.

## දුන් දෙය තමයි ලැබෙන්නෙ

ඉස්සර නම් දන්සල් වන්දනා කරන්නේ වෙසක් දවස් වලට රෑ ඇවිදලා මහන්සි වුණාම විතරයි. ඒත් දුර බැහැරින් එන සාමාන්‍ය පන්තියේ මිනිස්සු. දැන් ඒක මාර විදිහට වෙනස් වෙලා. දැන් දන්සල් වලට යන්නෙ ලොකු ලොකු වාහන වලින්. ඉස්සර වගේ දන්සැල් වලට යන්න ලැජ්ජාවෙ හිටිය මිනිස්සු ගැහැනු දැන් නෑ. බතුයි පරිප්පුයි සම්බෝලයි දුන්න දන්සල් දැන් කහබත් ෆ්‍රයිඩ් රයිස් දක්වා පරිවර්තනය වෙලා. මාර සතුටුයි ඒකට. කුරුම්බා ඔරෙන්ජ්බාර්ලි වල ඉඳලා රෝස්පාන් සීනි සම්බල් නූඩ්ල්ස් දක්වාත් ගිහින්. අලුත්ම තත්වෙ දැන් භූමිතෙල් සහ මුදල් දන්සලුත් තියෙනවා. ඒවා නම් අපේ රටේ තියෙන එක හොඳයි. මොකද ඉතින් අවුරුද්ද පුරාම කාගෙන් හරි කඩා වඩා ගන්න බලාගෙන ඉන්න මිනිස්සු අවුරුද්දේ එක දවසක් හරි අනුන්ට දෙන්න හිතන එක ලොකු දෙයක්.

දැන් දන්සල් පුරුද්ද මෙහෙටත් ඇවිත්. පන්සල්වලට සීමා වෙලා තිබුණ දන්සැල් දැන් මහා බත් දන්සල් දක්වා වර්ධනය වෙලා. මට නම් හිතුණේ පන්සලකට ආව මිනිහෙකුට කන්න බොන්න දුන්නත් දන්සල් දාලා කන්න දෙන්න තරම් ආහාර හිඟයක් මේ රටේ ඉන්න අයට තියෙනවාද කියන එකයි. ඒත් හැලම් වල තිබුණ දන්සලට ආව සෙනග දැකලා මට හිතුණේ මාර පිනක් ඇඹුලේ සෙට් එක කරගත්තා කියලා. තියෙන හැකි මිනිස්සු කොහොම හරි දෙන එක හොඳයි. වැඩියෙන් දෙන තරමට තමයි වැඩියෙන් ලැබෙන්නෙ. චේතනාව තමයි කර්මය වෙන්නෙ. එහෙමනෙ බුදු බණෙත් තියෙන්නෙ..

චූටි මල්ලි

## බොදු ගී නොගයන්නේ ඇයි ?

අතීත ග්‍රැමෆෝන්හි යුගයේ සිටම ශ්‍රී ලංකාවේ විවිධ ගායක ගායිකාවෝ බොදු ගී ගැයූහ. බුදුගුණ හි බොදු හැඟුම් මවන ගී ආදී වශයෙන් ඒවා සඳහන් කළ හැකිය.

ගුවන්විදුලියේ එකළ 'සරළ ගී' වැඩසටහන් ඉදිරිපත් කළ ගායක ගායිකාවන් එම වැඩසටහන්වලදී එක් බොදු බැතිගීයක් හෝ ගයන්නට අමතක කළේ නැත.

ඒ නිසාම අපේ ගී ලොවේ "බොදු ගී භාණ්ඩාගාරය" සපිරි පැවතුණේය.

එහෙත් වර්තමානයේ සිදුවී ඇත්තේ කුමක්ද? අද ගී ලොවේ සිටින ගායක ගායිකාවන් බහුතරය එකම බොදු ගීයක්වත් නොගැයූ අයයි. බෞද්ධ ගායක ගායිකාවන් තම ගීත ගිණුමට එකම බොදු ගීයක් හෝ එක් නොකිරීම ලජ්ජා සහගතය.

බෙග් මාස්ටර්ලාගේ වටිනාකම වඩ වාඩාත් මතුවී පෙනෙන්නේ මේ තත්වයන් තුලය. ප්‍රේම යාදිනී හා අඥේනා ගීත සිය ගණන් බිහිකර කන්කරච්චරයක් මවද්දී මේ නව පරපුරට එකම බොදු ගීයක් හෝ ගයන්නට සිත් පහළ නොවීම කණගාටුදායකය.

චිත්‍ර ශිල්පියකු මෙන්ම ගායකයකුද වන ජානක ඉලුක්කඹුර අතීතයේ ගුවන් විදුලියේ 'සරළ ගී' වැඩසටහනකට ගැවූ බුදුගුණ ගීයක් ගැන Face Book සඳහන් වූ පසුව ප්‍රතිචාර රැසක් ලැබී තිබුණි. එයින් පැහැදිලි වන්නේ ශ්‍රාවකයන් බොදුගී බලාපොරොත්තු වන බවය. එහෙත් මාධ්‍ය පවා කරන්නේ ඉඳහිට හෝ මතුවන බොදු ගී සැඟවීමය. "තිලොව දිනූ හිමි සඳුනේ " නමින් ගායක වජිර එදිරිමාන්න ගයා තිබූ බුදුගුණ ගීයක්ද ප්‍රචාරය නොකරන බව දැනගන්නට ලැබුණි.

මාධ්‍ය එසේ කරද්දී ශිල්පීන් අධෛර්යවීමටද ඉඩ තිබේ. ප්‍රවීන වාදකයෙකුද වන නිමල්සිරි කුරේ බොදු ගී ගණනාවක් ගයා ගුවන් විදුලියට බාර දී ඇතත් ශ්‍රාවකයා වෙතට නම් ගොස් නැතැයි දැනගන්නට ලැබුණි එමෙන්ම වසර දෙකකට පමණ පෙර බුද්ධශාසන අමාත්‍යංශය මගින් ජාතික වෙසක් දින උළෙල වෙනුවෙන් නිර්මාණය කර කසුන් කල්හා ගායනා කළ බොදු ගීතය එම උළෙලේදී මිස මේ දක්වා කිසිදු රාජ්‍ය මාධ්‍යයක ප්‍රචාරය / විකාශය කළා දැයි නොදනිමි. මහජන මුදල් වැය කර නිපදවන එවන් ගීතයක්වත් මාධ්‍ය මගින් මහජනතාව අතරට ගෙන නොයන්නේ නම් සෙසු ගී ගැන කවර කතාද?

වෙසක් සමයේ බොදු ගී ගැයෙන ප්‍රසංග විවිධ ආයතනවල පැවැත්වේ. එහෙත් ඒවාටද සහභාගි කරවා ගත හැක්කේ එකම ශිල්පීන් කොටසක් පමණක්වී ඇත්තේ නව පරපුර බොදු ගී ගැයීමෙන් ඈත්ව දවන්නට ගී ගයන මේ නව පරපුර සිත් නිවන්නට බොදු බැති ගී ගයන්නේ කවදාද?



ප්‍රවීණ සිනමා ලේඛක
ආනන්ද පද්මසරි




## ප්‍රහේලිකාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සි | | | 2 ච | | | 3 | 4 ය |
| | ■ | ■ | | ■ | ■ | 5 | |
| 6 | 7 ළ | | | ■ | 8 | සි | |
| ■ | | ■ | ■ | 9 අ | | | රේ |
| 10 | | 11 | ■ | ■ | දා | ■ | ■ |
| 12 ග | | ච | 13 | | | 14 | 15 ය |
| | ■ | 16 | ක | ■ | 17 ම | | |
| 18 ග | | | | | ■ | රූ | ■ |

### හරහට

1. අතීතාවර්ජනය
5. ධනය රැස්කරන මාධ්‍යයකි
6. අතීතයේ පාලකයන් විසූවේ මෙහිය
8. මගේ සිත
9. දේශපාලන තිඹිරිගෙයකි
10. අහරට ගන්නා ශාක කොටසකි
12. මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභාවකි
16. ආන්දෝලනාත්මක දේශපාලන පක්ෂයක ලාංඡනයයි
17. වාසනාව
18. සැරිසරන

### පහළට

1. ලෝපතල ගෞරවනීය නායිකාවකි
2. සමහරු තවමත් මෙහි වාසය කරති
3. මිනිස් සිත
4. යකුන්ට එරෙහි සටනට ගන්නා අවියකි
7. එක්තරා සාකච්චා මණ්ඩපයකි
8. මද වැසි සහිත කාලගුණය
10. බොහෝ දෙනා වෙහෙස වන්නේ මේවා මකාගැනීමටය
11. සාහිත්‍යකරනයේ දී හමුවන දෝශයකි
13. සමහර දේශපාලකයන් ගේ මුව මීට උපමා කෙරේ
14. උදාහිරු
15. අපාය මෙලෙස ද හැදින්වේ

ADVERTISE WITH සන්නස
First & Only Sri Lankan Magazine in Australia to Print All Pages in Full Colour

ADVERTISING OPTIONS

Option 1
Advertise in Sannasa Magazine

Option 2
Advertise in Sannasa.com.au official website

Option 3 සන්නස tv
Become a program sponsor for Sannasa TV | Launch date to be advised

Option 4
Advertise in Sannasa Mobile App | Launch date to be advised

SANNASA DISTRIBUTION MAP
5000 Copies Each Month




Now you can request pricing or
Submit your advertisement via our website
www.sannasa.com.au

Contact us for price guide & more information: 0426 959 540
info@sannasa.com.au

මිතුරු සන්නස Sannasa is launching their මිතුරු සන්නස foundation from May 2018. It's your great chance to be involved in a great cause without spending anything extra, because we are contributing $5 from each advertisement on each month towards the මිතුරු සන්නස. This foundation will help Sri Lankans in need of our help in many ways.
*Please be in touch with our Sannasa social media page and the website for more information.*